රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி:(94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்:(94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்:dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/පොදු/01
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி: / Date: 2023.03.14

අමාත්‍යාංශ ලේකම්වරුන්

**<u>රජයේ සේවයෙන් පරිබාහිර තනතුරු සඳහා සංවර්ධන නිලධාරීන් ද්විතියනය පදනම මත මුදාහැරිය හැකි ව්‍යවස්ථාපිත ආයතන පිළිබඳ තොරතුරු කැඳවීම</u>.**

2020-2022 කාලය තුළ රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත සංවර්ධන නිලධාරී සේවයට නවක නිලධාරීන් විශාල ප්‍රමාණයක් බඳවාගනු ලැබ ඇති අතර එක් එක් අමාත්‍යාංශවල/දෙපාර්තමේන්තුවල විෂය පථය අනුව සංවර්ධන නිලධාරී කාර්යමණ්ඩල අවශ්‍යතාව සහ තත්‍ය කාර්යමණ්ඩලය සැලකිල්ලට ගෙන මේ වන විට එක් එක් ආයතනයේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරු සංඛ්‍යාව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අනුමත කර ගනිමින් පවතී. එහිදී සේවා අවශ්‍යතාව අනුව ඇතැම් ආයතනයන්හි සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් අතිරික්තයක් මෙන්ම ඇතැම් ආයතනවල පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය වී ඇත.

02. රාජ්‍ය සේවයට බඳවාගනු ලැබ ඇති සංවර්ධන නිලධාරීන් කාර්යාලගත සහ ක්ෂේත්‍රගත රාජකාරී සඳහා අනුයුක්ත කෙරෙන අතර මෙම නිලධාරීන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ උසස් අධ්‍යාපනය ලබා ඇති බැවින් ඔවුන්ගේ දැනුම,හැකියාව ඔප්නැංවෙන පරිදි වඩාත් ඵලදායී හා ප්‍රශස්ථ සේවාවක් ලබා ගැනීම සඳහා ඔබ අමාත්‍යාංශය යටතේ පවත්නා ව්‍යවස්ථාපිත ආයතනවල පවත්නා පුරප්පාඩු තනතුරු සඳහා අනුයුක්ත කිරීමේ හැකියාවක් පවතී නම් ඒ සඳහා අතිරික්ත නිලධාරීන් තාවකාලික පදනමින් මුදාහැරීම සම්බන්ධව සලකා බැලීම පිණිස පහත ආකෘතිය අනුව සකස් කරන ලද තොරතුරු මා වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

| අනු අංකය | ව්‍යවස්ථාපිත ආයතනයේ නම | ආයතනයේ ස්වභාවය (අධිකාරියක්/ සංස්ථාවක්/ වෙනත්- සඳහන් කළ යුතුය) | තාවකාලික පදනමින් සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීමට නෛතික වශයෙන් බාධාවක් තිබේද (ඇත/නැත) | එසේ නිලධාරීන් අනුයුක්ත කරන්නේ නම්, එය රජයේ අවශ්‍යතාවයක් ලෙස සැලකිය හැකිද යන්න (ඔව්/ නැත) | නිලධාරීන් අනුයුක්ත කළ හැකි ස්ථානය (ප්‍රධාන කාර්යාල, ප්‍රාදේශීය කාර්යාල) හා නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්